www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: රුදුරු කප්පාදු පිලිවෙත් ක්‍රියාවට දැමීම සඳහා “ජාතික සමගි ආන්ඩුවක්”

**ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි**
**2015 අගෝස්තු 22**

එක්සත් ජාතික පක්ෂයේ (එජාප) නායක රනිල් වික්‍රමසිංහ බදාදා මාධ්‍ය හමුවක් අමතමින් "ජනතාවගේ ප්‍රශ්න විසඳීම සඳහා එකඟතාවෙන් කටයුතු කිරීමට" පෙරට එන ලෙස පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම පක්ෂවලින් ඉල්ලා සිටියේය. ඇත්ත වසයෙන් ම මෙය වඩ වඩා නරක අතට හැරෙන ආර්ථික අර්බුදයක් මධ්‍යයේ ජාත්‍යන්තර මුල්‍ය අරමුදල (ජාඅමු) විසින් නිර්දේශිත කප්පාදු වැඩපිලිවෙල ක්‍රියාවට දමන ජාතික ආන්ඩුවක් සඳහා කල කැඳවුමකි.

සඳුදා මහ මැතිවරනයේ දී, එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයෙන් යුතු යහපාලනය සඳහා එක්සත් ජාතික පෙරමුන (යූඑන්එෆ්ජීජී) වැඩි ආසන සංඛ්‍යාවක් ජයග්‍රහනය කල ද, පාර්ලිමේන්තුවේ තනි බහුතරයක් සඳහා එයට ආසන හතක් අඩු විය. වික්‍රමසිංහ ඉහත ප්‍රකාශය කලේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) නායකයා සහ යූඑන්එෆ්ජීජී සමග සහාග ආන්ඩුවක් පිහිටුවීම සඳහා එය තල්ලු කරන ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන සමග සාකච්ඡා කිරීමෙන් පසුව ය. සිරිසේනගෙන් සහතිකයක් ලැබීමෙන් පසු, වික්‍රමසිංහ රටේ නව අගමැති ලෙස අද දිවුරුම් දීමට නියමිතය.

දේශපාලන පක්ෂ වලට එකට වැඩ කිරීම සඳහා "විකල්ප දෙකක්" පවතින බව වික්‍රමසිංහ ප්‍රකාශ කලේ ය. "ඔවුන්ට එක්කෝ ආන්ඩුවේ ඇමතිකම් බාර ගත හැකියි. නැති නම්, ආන්ඩුවේ සැලසුම් ක්‍රියාත්මක කිරීම ට උපදෙස් දෙන අධීක්ෂන කමිටුවේ වගකීම් බාර ගනිමින් පාර්ලිමේන්තුවේ දී අපට සහයෝග දිය හැකිය. ආන්ඩුවේ සැලසුම් අධීක්ෂනය කිරීමේ ඊනියා අධීක්ෂන කමිටුවක් පිහිටුවීමේ එජාප යෝජනාව එහි පිලිවෙත් වලට සෙසු පක්ෂ පෙල ගස්වා ගැනීමේ වෑයමකි.

"අවම වසයෙන් වසර දෙකක් සම්මුතියෙන් කටයුතු කිරීමට (සහ) රට ට බලපාන මූලික ප්‍රශ්න පිලිබඳව පොදු එකඟත්වයකට පැමිනීම ට." සියලු දේශපාලන පක්ෂ වලට වික්‍රමසිංහ අයාචනා කලේ ය. යූඑන්එෆ්ජීජී ක්‍රියාකාරී වැඩපිලිවෙල "පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බවත් සියලු දෙනාගේ එකඟත්වය ඇතිව ජාතික ප්‍රතිපත්ති රාමුවක් සකස් කරන" බවත් ඔහු පැවසුවේ ය.

වික්‍රමසිංහ ගේ ඉල්ලීම ඉදිරිපත් කෙරුනේ ශ්‍රීලනිප යේ මැතිවරන උද්ඝෝෂනය මෙහය වූ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂට එරෙහිව යූඑන්එෆ්ජීජී ය සමග සිරිසේන පෙල ගැසුනු කටුක මැතිවරන සටනකින් පසුව ය. සිකුරාදා ශ්‍රීලනිපයේ සහ එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) යේ ලේකම්වරුන් නෙරපමින් පසුගිය සතිය පුරා සිරිසේන රාජපක්ෂ ගේ ආධාරකරුවන් පක්ෂය තුලින් විරේක කලේ ය. ඔහු සඳුදා ශ්‍රීලනිප මධ්‍යම කාරක සභාවේ සාමාජිකයන් 13 ක් ඉවත් කලේ ය.

වික්‍රමසිංහ හමුවීමෙන් පසු, සිරිසේන ජාතික සමගි ආන්ඩුවක් සඳහා සැලසුම් සාකච්ඡා කිරීම ට ඊයේ ශ්‍රීලනිප කාරක සභාව කැඳෙව්වේ ය. සති ගනනක් ජනාධිපති මධ්‍යම කාරක සභාව රැස්වීම අවහිර කල අතර ඒ සඳහා ඔහු අධිකරන තහනම් නියෝගයක් ද ලබා ගත්තේය.

වසර දෙකක් සඳහා යූඑන්එෆ්ජීජී සමග "ජාතික ආන්ඩුවක්" පිහිටුවීමට මධ්‍යම කාරක සභාව එකඟ වී ඇති බව සිරිසේන විසින් පත් කරන ලද ශ්‍රීලනිප යේ වැඩ බලන ලේකම් දුමින්ද දිසානායක මාධ්‍ය වලට ප්‍රකාශ කලේ ය. අවබෝධතා ගිවිසුමක් පිලියෙල කරන බවත් එය අත්සන් කලොත් ශ්‍රීලනිප යේ සාමාජිකයන් කිහිප දෙනෙකු නව ආන්ඩුවේ ඇමතිකම් බාර ගනු ඇති බවත් ඔහු කීවේ ය.

මැතිවරනයෙන් යන්තම් දින තුනකට පසු ගනු ලබන මෙම කඩිනම් පියවරයන් ගේ එල්ලය රාජපක්ෂ පසෙකට තල්ලු කිරීම සහ අන් සියල්ලට ම ත් වඩා එක්සත් ජනපද ගැති විදේශ ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යාම හා රුදුරු කප්පාදු පිලිවෙත් ක්‍රියාවට දැමීම ය.

වික්‍රමසිංහ සහ හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග ගේ සහයෝගය ඇතිව එක්සත් ජනපදය විසින් මෙහය වූ පාලන තන්ත්‍ර මරුවක දී ජනවාරි ජනාධිපතිවරන යේ දී සිරිසේන විසින් රාජපක්ෂ බලයෙන් පහ කරන ලදී. අගමැති වීමේ බලාපොරොත්තු ව ඇතිව රාජපක්ෂ සඳුදා පැවති පාර්ලිමේන්තු මැතිවරනය ට තරග කල නමුත්, එජනිසට හිමි වූයේ ආසන 95 පමනි.

රාජපක්ෂ ඉවත් කිරීම, කලාපය තුල චීනයේ බලපෑම යටපත් කිරීමේ හා චීනයට එරෙහිව යුද්ධය සූදානම් කිරීමේ වොෂින්ටනයේ වඩාත් පුලුල් "ආසියාවට හැරීමේ" කොටසකි. එක්සත් ජනපදය රාජපක්ෂ සමග විරසක වූයේ; බීජිනය සමග ඔහුගේ සමීප සම්බන්ධතා සහ චීන ආධාර හා ආයෝජන මත ඔහු රඳා පැවතීම නිසා ය.

ජනවාරි මැතිවරන ජයග්‍රහනයෙන් පසු ව, සිරිසේන සුලුතර එජාප ආන්ඩුව ගෙනයාම සඳහා වික්‍රමසිංහ අගමැති ලෙස පත් කලේ ය. රාජ්‍ය ලේකම් ජෝන් කෙරී ඇතුලු

එක්සත් ජනපද ඉහල නිලධාරීන් කන්ඩායමක් කොලඹට පැමිනීමත් සමග ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය වේගයෙන් වොෂින්ටනය දෙසට මාරු විය

සඳුදා මැතිවරනයෙන් ඉක්බිති ව, "එක්සත් ජනපදය ජනාධිපති සිරිසේන, අගමැති, හා නව රජය සමග සහයෝගයෙන් කටයුතු කිරීමට බලාපොරොත්තු වන" බව එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රකාශක ජෝන් කර්බි ප්‍රකාශ කලේ ය.

විදේශ ප්‍රතිපත්තිය මත බෙදී සිටින නමුත් වැඩකරන ජනතාව මතට ගැඹුරු වන ආර්ථික අර්බුදයේ බර පැටවීමේ ඔවුන්ගේ අධිෂ්ඨානය තුල එජාප සහ ශ්‍රීලනිපය ඒකාබද්ධ ව සිටින බවට මැතිවරන කාලය තුල දී අනතුරු ඇඟවූයේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) පමනි. ජාතික සමගි ආන්ඩුවක් පිහිටුවීමේ පැහැදිලි අරමුන එයයි.

හිටපු බැංකු කරුවෙකු හා වික්‍රමසිංහ ගේ සමීප මිතුරෙකු වන ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අර්ජුන් මහේන්ද්‍රන්, *ෆිනෑන්ෂල් ටයිම්ස්* පත්‍රයට අදහස් ප්‍රකාශ කිරීමේ දී ඇත්ත න්‍යාය පත්‍රය එලියට දැම්මේ ය. නැගී එන ජාතික නය විසින් නිෂ්පාදනය කරනු ලැබ ඇති ආර්ථික ප්‍රශ්න සහ අඩු බදු ආදායම ගැන සඳහන් කිරීමෙන් පසු, මුදල් සම්පූර්නයෙන් ම පරිවර්තනය කිරීම සහ මග පෙන්වීම සඳහා "රැඩිකලී ව වෙනස් වූ නීති පද්ධතියක්" නව ආන්ඩුව විසින් සකස් කරනු ලබන බව ඔහු කීවේ ය.

"අපේ විදේශ සංචිත තව ටිකක් ශක්තිමත් වූ විට අපි මේ මහා පිපිරුම් ප්‍රතිසංස්කරන සමග ඉදිරියට යන්න කැමති," බව මහේන්ද්‍රන් පැවසූ වේ ය. රුපියල සම්පූර්නයෙන්ම පරිවර්තනය කිරීම සීඝ්‍ර අවප්‍රමානයක ට ඉඩ සලසන අතර කම්කරුවන්ගේ හා ගම්බද දුගීන් ගේ ජීවන තත්වයන් කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරනු ඇත. එමෙන් ම එය තවදුරටත් විදේශ ආයෝජන වලට රට විවෘත කිරීමේ හා කම්කරු පන්තිය සූරාකෑම තීව්‍ර කිරීමට ඉලක්ක කෙරුන දුර දිග යන වෙලඳපොල ගැති පිලිවෙත් වල පලමු පියවර පමනි.

මැතිවරන සමයේ සඳහන් කල පරිදි, යුඑන්එෆ්ජීජී ක්‍රියාකාරී සැලැස්මට ජාත්‍යන්තර සහ දේශීය ආයෝජකයන් සඳහා ත්‍යාගශීලී බදු සහන සහිත දිවයින පුරා නිදහස් වෙලඳ කලාප 45 පිහිටුවීම සහ ලෝක වෙලඳ පොලට ගොවීන් ගැට ගසන "පොකුරු ගම්මාන" පිහිටුවීම ඇතුලත් වේ.

එජාපය පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීම ට සැලසුම් කරන බවත් එවිට එම ව්‍යවසායන්ට "භාන්ඩාගාරය මත යැපෙන්නේ නැතිව ස්වයං-මූල්‍ය තත්වයක් ඇති කර ගත හැකි" බවත් මුදල් ඇමති රවී කරුනායක පසු ගිය සතියේ ප්‍රකාශ කලේ ය. මෙම රාජ්‍ය ව්‍යවසායන් කලමනාකරනය කිරීම සඳහා සමාගමක් පිහිටුවන බව යුඑන්එෆ්ජීජීයේ මැතිවරන ප්‍රකාශන යේ සඳහන් විය.

ලංකා විදුලිබල මංඩලය (ලංවිම), ලංකා ඛනිජතෙල් සංස්ථාව (ලංඛස), ජල සම්පාදන මංඩලය සහ ශ්‍රී ලංකා දුම්රිය සේවය මෙම රාජ්‍ය ව්‍යාවසායන ට ඇතුලත් වේ. එම ප්‍රකාශය රාජ්‍ය ව්‍යවසායන් "ස්වයං-මූල්‍ය යැපීමකට" ගෙන ඒමේ ජාමූඅ ඉල්ලීම නව ආන්ඩුව ඉටු කරන බවට දෙන ලද පැහැදිලි සහතිකයකි. එය මෙම ව්‍යවසායන් මුලුමනින් ම පුද්ගලීකරනය කිරීමේ දිසාව ට තබන පියවරකි.

නව රජය මුහුන දී සිටින්නේ "මහා පිපිරුම් ප්‍රතිසංස්කරන" ක්‍රියාවට දමන ලෙස ජාමූඅ යොදන පීඩනයට පමනක් නොවේ; ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ දුර්වලකම් පෙන්වා දෙමින් පිච් රේටින් ආයතනය බදාදා "ප්‍රතිපත්ති ගැන බරපතල පැහැදිලි කිරීමක්" ආන්ඩුවෙන් ඉල්ලා සිටියේ ය.

බීබී ශ්‍රේනියට ගැනෙන "පෘතුගාලය, හංගේරියාව සහ ක්‍රොෂියාව" ට පසුව අනෙක් කවර හෝ රටකට වඩා ශ්‍රී ලංකාවේ "රාජ්‍ය නය හතර වන තැන" පවතින - දල ජාතික නිෂ්පාදනයෙන් සියයට 72 ක් - බව ෆිච් වාර්තාව සඳහන් කලේ ය. "කෘෂිකර්ම සහ ඇඟලුම් අපනයන් එකතැන පල්වෙමින් අපනයනය නොවෙනස් ව පවතින අතර" නය ඉහල යාම තීව්‍ර වී පාරිභෝගික භාන්ඩ ආනයනය වාර්ෂික පදනමින් සියට 45 වර්ධනය වී ඇත. රාජ්‍ය බැඳුම්කර නිකුත් කරමින් ආන්ඩුව දැක් වූ ප්‍රතිචාරය රටේ නය අර්බුදය උග්‍රවීමට තුඩු දුනි.

මෙය ඉතා සියුම් අනතුරු ඇඟවීමකි. ආන්ඩුව සිය ආර්ථික පිලිවෙත් ගැන බැරෑරුම්ව "පැහැදිලි" නොකරන්නේ නම්, එනම් කප්පාදු පිලිවෙත් ක්‍රියාවට දැමීමට පියවර නො ගන්නේ නම් විදේශ අන්තරායට මුහුන දීමේ ආන්ඩුවේ ශක්‍යතාවය පිලිබඳ රේට්ටුව පහත දමනු ඇත. ග්‍රීසිය තුල ක්‍රියාවට දැමූ දැඩි කප්පාදු පිලිවෙත් අනුයමින් කම්කරු පන්තියේ සමාජ තත්වයන්ට රුදු ප්‍රහාර එල්ල කරන ලෙස ජාත්‍යන්තර මූල්‍ය ප්‍රාග්ධනය ශ්‍රී ලංකා ආන්ඩුවට අවධාරනය කරයි.

මහ ව්‍යාපාරිකයන් ගේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික සමගි ආන්ඩුවක් සඳහා පාලක පන්තියේ වේගවත් හැරීම, සියලු ම ධනපති පක්ෂ, ශ්‍රීලනිප සහ එජාප යන දෙකින් ම සහ ඔවුන්ගේ සහචරයන්ගේ කැඩී කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය සඳහා සටන් කිරීමේ අවශ්‍යතාවය ගැන මැතිවරන උද්ඝෝෂනයේ දී සසප කල අවධාරනයේ වැදගත්කම තහවුරු කරයි. වැඩ කරන ජනතාවගේ සමාජ හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එල්ල වන ප්‍රහාර නතර කිරීමට ඇති එකම මාවත වන්නේ දකුනු ආසියාවේ හා ලෝක සමාජවාදය සඳහා අරගලයේ අවියෝජනීය කොටසක් ලෙස සමාජවාදී ප්‍රතිපත්ති ක්‍රියාවට දමන කම්කරු ගොවි ආන්ඩුවක් සඳහා ඒකාබද්ධ අරගලය වේ.

© www.wsws.org